**සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් අරමුදල - 2014**

--------------------------------------------------------------------------------

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, අරමුදලේ වෙනස්වීම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරුතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 479 (6) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 **විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගම් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගම් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සමාගම් අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාගම් අරමුදල මඟින් දරනු ලැබූ රු. 757,360 ක් වූ ස්ථාවර වත්කම් මිලදී ගැනීම සඳහා දරන ලද වියදම්, අයභාර වියදම් ලෙස ගිණුම් ගතකර තිබුණි.

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 94 (1) | වෙනත් ආකාරයකට විධිවිධාන සලසා ඇති අවස්ථාවලදී හැර වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම වියදමකට හෝ බැදීමකට නොබැඳී සිටිය යුතු වුවත්, වාර්ෂික ඇස්තමේන්තුවල ඇතුළත් ප්‍රතිපාදන පිළිබඳ නොසලකා එකතුව රු.1,141,045 ක් වියදම් කර තිබූ අතර එම වියදම් අදාළ වැය ශීර්ෂය හැර වෙනත් වැය ශීර්ෂවලට හර කර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 225 (2) (අ) | තැන්පතු වලින් කෙරෙන ගෙවීම් සඳහා පොදු 70 ආකෘති පත්‍රය භාවිතා කළ යුතු වුවද, රු.1,796,781 ක වියදම් සඳහා එම ආකෘති පත්‍රය භාවිතා කර නොතිබුණි. |

| | |
|---|---|
| (iii) මුදල් රෙගුලාසි 395 (ඇ) | බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර ඊලඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, බැංකු ගිණුම් 05 කට අදාළව ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 730 (1) | භාණ්ඩවල හරි වැරදි බැලීමෙන් පසුව, ඒවා ලැබුණු බව දන්වා, එකී භාණ්ඩ භාරගෙන, බඩු වට්ටෝරු පොතෙහි නියමිත පරිදි සටහන් කළ යුතු වුවද, මෙම විධිවිධානයෙන් බැහැරව කටයුතු කළ අවස්ථා තිබුණි. |
| (v)මුදල් රෙගුලාසි 752 (i), 752(ii), 752(iii) | භාණ්ඩ නිකුත් කිරීමේදී බඩු වට්ටෝරු පොතේ නිකුත් කිරීම් පැත්තෙහි විස්තර සටහන් කළ යුතු වුවද, එසේ සිදු නොකළ අවස්ථා නිරීක්ෂණය විය. |
| (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| (i) 4.2.1 (ඉ) ප්‍රසම්පාදන සැලැස්ම | අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා පිළියෙල කරන ලද ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස හයකට වැඩි නොවන කාලයක් තුළදී නිතිපතා යාවත්කාලීන කළ යුතු වුවද, අරමුදල විසින් එසේ කර නොතිබුණි. |
| (ii) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.4 වගන්තිය | පිළිගත හැකි අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් ඉදිරිපත් කිරීම මත, කොන්ත්‍රාත් මුදලින් සියයට 20 ක උපරිමයක් ගෙවිය යුතු වුවද, එම විධිවිධානවලට පටහැනිව අරමුදල විසින් සමාගම් මැදුර ගොඩනැගිල්ල අළුත්වැඩියාව සඳහා උපදේශාත්මක සේවා සැපයීම වෙනුවෙන් මහවැලි උපදේශක සේවා කාර්යාංශයට, උපදේශන සේවා ඇස්තමේන්තුවෙන් සියයට 50 ක අත්තිකාරම් මුදලක් එනම් රු. 250,000 ක් ගෙවා තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.385,906,578 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.351,550,815 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.34,355,763 ක හෙවත් සියයට 9.7 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මූල්‍ය වාර්තා ලියාපදිංචිය සියයට 245 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

පෙර වර්ෂයට සාපේක්ෂව, සමාලෝචිත වර්ෂයේ ආදායම් ප්‍රභවයන්ගේ වැඩිවීමක් සිදු වී තිබුණද, මූල්‍ය වාර්තා ලියාපදිංචි කිරීමේ ආදායම සියයට 245 කින් සහ ලේකම්වරු ලියාපදිංචි කිරීමේ ආදායම

සියයට 28 කින් වැඩිවී තිබුණද, ආකෘති පත්‍ර ලියාපදිංචි කිරීම හා වාර්ෂික වාර්තා ලියාපදිංචි කිරීමේ ආදායම වැඩිවීමේ වේගය සාපේක්ෂව අඩු වී තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

---

4.1 **කාර්යසාධනය**

---

(අ) සමාලෝචිත වර්ෂය සඳහා සමාගම් සහ අනෙකුත් ලියාපදිංචි කිරීම් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| **කාර්යය** | **සංඛ්‍යාව** | | **වෙනස අඩුවීම/වැඩිවීම** | **ප්‍රතිශතය** |
|---|---|---|---|---|
| | **2014** | **2013** | | |
| සමාගම් ලියාපදිංචි කිරීම | 7,100 | 6,047 | 1,053 | 17.41 |
| ගොනු පරීක්ෂා කිරීම් | 10,838 | 10,847 | (9) | (0.08) |
| නාම අනුමත කිරීම | 13,260 | 12,075 | 1,185 | 9.8 |
| පිටපත් සහතික කිරීම | 43,379 | 36,531 | 6,848 | 18.74 |
| ආකෘති පත්‍ර ලියාපදිංචි කිරීම | 72,644 | 70,659 | 1,985 | 2.80 |
| වාර්ෂික වාර්තා ලියාපදිංචි කිරීම | 31,324 | 29,853 | 1,471 | 4.93 |
| මූල්‍ය වාර්තා ලියාපදිංචි කිරීම | 2,376 | 2,867 | (491) | (17.12) |
| ආකෘති පත්‍ර අලෙවිය | 3,478 | 4,207 | (729) | (17.33) |
| ලේකම්වරුන් ලියාපදිංචි කිරීම | 566 | 437 | 129 | 29.52 |

මූල්‍ය වාර්තා ලියාපදිංචි කිරීම, ආකෘති පත්‍ර අලෙවිය හා ගොනු පරීක්ෂා කිරීම යනාදියේ ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව, සමාලෝචිත වර්ෂයේදී අඩු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලියාපදිංචි සීමිත සමාගම් වලින් වාර්ෂික වාර්තා ඉදිරිපත් කළ යුතු සීමිත සමාගම් සංඛ්‍යාව 59,113 ක් විය. එසේ වුව ද එදිනට වාර්ෂික වාර්තා ඉදිරිපත් කළ සීමිත සමාගම් සංඛ්‍යාව 14,886 ක් වූයෙන් වාර්ෂික වාර්තා ඉදිරිපත් නොකළ සීමිත සමාගම් ප්‍රමාණය 44,227 ක් වූ අතර එම නිසා එදිනට අයකර නොගත් හිඟ වාර්ෂික වාර්තා ලියාපදිංචි කිරීමේ ආදායම රු.221,135,000 ක් විය. ඉන් රු.147,423,333 ක ප්‍රමාණයක් සමාගම් අරමුදලට හිඟහිට තිබූ අතර, ඒකාබද්ධ අරමුදලට බැර නොවූ ප්‍රමාණය රු. 73,711,667 ක් විය.

(ඇ) **2007 අංක 07 දරන සමාගම් පනත**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) **සීමිත සමාගම් නියාමනය**

---

සමාගම් පනතට අනුකූලව සීමිත සමාගම් ලියාපදිංචි කිරීම සහ එමඟින් නියම කර ඇති විධිවිධානවලට අනුකූලව ලියාපදිංචි සමාගම්වල කටයුතු මෙහෙයවීම සහ ඒ අනුව ක්‍රියාකරන බවට වග බලා ගැනීමත්, එසේ ක්‍රියා නොකරන අවස්ථාවලදී සමාගම් පනතෙන් නියම කර ඇති බලතල අනුව ක්‍රියාකර ලියාපදිංචි සමාගම්වල කටයුතු සමාගම් පනතේ නියම කර ඇති විධිවිධානවලට අනුකූලව පවත්වා ගෙන යාමට කටයුතු කරවීම සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්ට ඉහත සමාගම් පනතෙන්

පැවරී ඇති ව්‍යවස්ථාපිත කාර්යයක් වුවත්, ලියාපදිංචි සමාගම්වල කටයුතු නියාමනය දුර්වල තත්ත්වයක පැවති බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය. එසේම සමාගම්වල කටයුතු නියාමනය සඳහා වූ ක්‍රියාකාරී වැඩපිළිවෙලක් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව සතුව නොතිබුණි.

(ii) **විගණකවරුන් ලියාපදිංචි කිරීම හා ලියාපදිංචිය අලුත් කිරීම**

---

සමාලෝචිත වර්ෂයේදී නව විගණකවරුන් 77 දෙනෙකු අලුතෙන් ලියාපදිංචි වී තිබූ අතර, ඉන් ලැබූ ආදායම රු. 136,590 ක් විය. 2013 වර්ෂයේදී අලුතෙන් ලියාපදිංචි වූ 74 දෙනෙකුගෙන් ලැබූ ආදායම රු. 9,900 ක් වූයෙන් පසුගිය වර්ෂයට සාපේක්ෂව ආදායම සියයට 1279 ක ප්‍රමාණයකින් වැඩි වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි විගණකවරුන්ගේ අලුත් කිරීම් 532 ක් වූ අතර ආදායම රු. 927,632 ක් විය. පසුගිය වර්ෂයේදී එම ප්‍රමාණය 556 ක් වූ අතර ලැබූ ආදායම රු. 12,232 ක් විය. මෙසේ ඉකුත් වර්ෂයට සාපේක්ෂව, සමාලෝචිත වර්ෂයේදී ඉහත ලියාපදිංචිය අලුත් කිරීමේ සංඛ්‍යාව 24 කින් අඩු වුවද ආදායම රු. 915,400 කින් වැඩි වීමට සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 01 දින සිට නව ගණන් පරීක්ෂකවරු ලියාපදිංචිය සහ අළුත් කිරීමේ ගාස්තු වැඩිකිරීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී 1891 අංක 16 දරන සමිති ආඥා පනත යටතේ සමිති 67 ක් ලියාපදිංචි කර තිබූ අතර, ඉන් ලැබුණ ආදායම රු. 9,325 ක් විය. පසුගිය වර්ෂය සඳහා සමිති 169 ක් ලියාපදිංචි කර තිබුණද ඉන් ලැබුණ ආදායම රු. 4,225 ක් විය. සමාලෝචිත වර්ෂයේ අගෝස්තු 01 දින සිට සමිති ආඥා පනත යටතේ අය කරනු ලැබූ මුද්දර ආදායම අහෝසි කොට ගාස්තු අය කිරීමේ ක්‍රමයක් හඳුන්වා දීම ආදායම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ඉ) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනතේ විධිවිධාන අනුව රු. මිලියන 5 ක් ඉක්මවන සියලුම කොන්ත්‍රාත් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා යටතේ ලියාපදිංචි කළ යුතු අතර, සමාලෝචිත වර්ෂයේදී ලියාපදිංචි කර තිබූ පොදු කොන්ත්‍රාත් සංඛ්‍යාව 10,384 ක් වූ අතර, ඉන් ලද ආදායම රු. 17,016,000 ක් විය. ඉකුත් වර්ෂයේදී එම ප්‍රමාණය 4,320 ක් වූ අතර ලැබුණු ආදායම රු.6,966,000 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී ලියාපදිංචි කර තිබූ පොදු කොන්ත්‍රාත් සංඛ්‍යාව 6,064 කින් වැඩිවී තිබූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 140 කි.

4.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.**

---

සීමිත සමාගම් ලියාපදිංචි කිරීමේ කාර්යය පරිගණකගත කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් වූ කොන්ත්‍රාත්තුව 2014 ජනවාරි 21 වන දින පෞද්ගලික ආයතනයකට රු.88,812,227 ක මුදලකට පිරිනමා තිබූ අතර කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව එහි වැඩ කටයුතු 2014 ඔක්තෝබර් 20 දිනට පෙර අවසන් කළ යුතු වුවත්, මේ වන විට කොන්ත්‍රාත්කරු එහි වැඩ කටයුතු අතරමග නවතා දමා කොන්ත්‍රාත්තුව හැර දමා ගොස් තිබුණි. කොන්ත්‍රාත්තුව අදාළ ආයතනය වෙත භාර දෙනු ලැබූ අවස්ථාවේදී සමාගම් සහ සමිති ලිපිගොනු 61,000 ක ප්‍රමාණයක් ස්කෑන් කිරීම සඳහා ගිවිස ගෙන තිබුනද, කොන්ත්‍රාත්කරු ලිපිගොනු 33,938 ක් පමණක් ස්කෑන් කර තිබුණි. දෙපාර්තමේන්තුව විසින් කොන්ත්‍රාත්තුවේ කටයුතු නිසි පරිදි මෙහෙයවීම සහ අධීක්ෂණය කර නොතිබූ බව නිරීක්ෂණය වූ අතර, පසු විපරම් ක්‍රියාවලියක් හා ප්‍රගති

සමාලෝචන ක්‍රියාවලියක්ද සිදුකර නොතිබුණි. කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් ප්‍රසම්පාදන සංග්‍රහයේ 5.4.8 (අ) වගන්තිය ප්‍රකාර කාර්යසාධන ඇපකරයක් කොන්ත්‍රාත්කරුගෙන් ලබා නොගෙන කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

මේ නිසා දැනට වැඩ කටයුතු නැවතී ඇති සහ කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව හැර දමා ගොස් ඇති මෙම ව්‍යාපෘතිය සඳහා මෙතෙක් දරා තිබූ රු.13,619,577 ක් වූ මුදල නිෂ්කාර්ය වියදමක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය. කෙසේ වුවද අරමුදල විසින් මෙහි ප්‍රයෝජනවත්භාවය නොසලකා වැයකළ සියළුම මුදල් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ආ) සමාගම් මැදුර ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව පෞද්ගලික සමාගමක් වෙත රු. 12,664,317 කට 2014 අප්‍රේල් 23 දින පවරා තිබූ අතර, ගිවිසුම් ප්‍රකාරව 2014 දෙසැම්බර් 31 දිනට එහි වැඩකටයුතු අවසන් කළ යුතු වුවත්, මේ දක්වා එහි වැඩ කටයුතු අවසන් කර නොතිබුණි. වැඩ ප්‍රමාදය සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාර දඩ මුදල් අයකිරීමක්ද කර නොතිබුණි.

4.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-------------------------------

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි අලුත්වැඩියාවේදී ගලවා ඉවත් කරනු ලැබූ වීදුරු පිළිබඳ විස්තර සමාලෝචිත වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මඟින් දක්වා නොතිබූ අතර, ඒවායේ අගයද ගණනය කර නොතිබුණි. මාස 06 කට වඩා වැඩි කාලයක් සුරක්ෂිතභාවයකින් තොරව තැනින් තැන අතරමග දමා කැඩීයමින් තිබූ මෙම වීදුරු එකතු කර වෙන්දේසි කිරීමටද කටයුතු කර නොතිබුණි.

4.4 **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2007 අංක 07 දරන සමාගම් පනතේ කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීමේදී සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් දරනු ලබන සියලුම වියදම් අරමුදලින් දැරිය හැකි වුවත්, සමාගම් පනතේ 4 වන උප වගන්තිය යටතේ අනුමත වියදම් යටතට නොගැනෙන, සීමිත සමාගමකට අයත් කොටස් මිලදී ගැනීම සඳහා රු. 90,275,000 ක් වැයකර තිබුණි. මේ දක්වා මෙම ආයෝජනයෙන් කිසිදු ප්‍රතිලාභයක් සමාගම් අරමුදලට ලැබී නොතිබුණි. එසේම මෙම කොටස්වල අයිතිය සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයට හිමි වී තිබුණි. අදාල සමාගම් බුන්වත්වීම නිසා එය ඈවර කිරීමට තීරණය කර තිබූ අතර ඉහත ආයෝජිත මුදලට අදාල අයිතිවාසිකම් හෝ ආයෝජිත මුදල් සමාගම් අරමුදලට ලබාගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් මේ දක්වා ගෙන නොතිබුණි.

(ආ) සමාගම් අරමුදලේ අරමුණු හා කටයුතුවලින් බාහිර කටයුතු සම්බන්ධයෙන් වූ පුවත්පත් දැන්වීම් පළ කිරීම සඳහා එකතුව රු. 599,200 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී අරමුදලෙන් වැයකර තිබුණි.

4.5 **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ කටයුතු පරිගණකගත කිරීමේ වැඩසටහන යටතේ ස්කෑන් කරන ලද (scan) ලිපිගොනු තැන්පත් කිරීම සඳහා මිලදී ගන්නා ලද රු.453,750 ක් වටිනා රාක්ක 15 ක් භාවිතයෙන් තොරව ලේඛනාගාරයේ ගබඩා කර තිබුණි.

(ආ) ප්‍රතිව්‍යුහගතකරණය යටතේ ස්කෑන් කරන ලද (scanned) ලියකියවිලි නැවත ගොනු ගත කිරීම සඳහා විශේෂයෙන් සකස් කරන ලද රු. 2,180,000 ක් වටිනා ෆයිල් කවර (four holes files) 2014 නොවැම්බර් 24 දින මිලදී ගෙන තිබු නමුත් ඉන් 54,500 ක ප්‍රමාණයක් මෙතෙක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඇ) 2015 දැයට කිරුළ වැඩසටහනට සමගාමීව පාසල්වල පුස්තකාල අතර බෙදාදීම සඳහා මිලදී ගන්නා ලද රු. 683,910 ක් වටිනා පොත් පාසල්වලට බෙදා දීමකින් තොරව ගබඩාවේ ගබඩා කර තිබුණි. එම පොත් බෙදාදීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් 2015 මාර්තු 27 දින වන විටත් ගෙන නොතිබුණි.

(ඇ) සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ, අභ්‍යන්තර විගණන අංශයක් වෙනම ස්ථාපනය කිරීම සඳහා රු. 147,360 ක් වැයකර තිබුණද, එම අංශය වර්තමානයේ අක්‍රීය තත්ත්වයට පත්වී තිබුණි. මේ නිසා ඉහත මුදල් දරා මෙම අංශයට ලබා ගන්නා ලද පරිගණක සහ අන්තර්ජාල පහසුකම් ඌන උපයෝජිත තත්ත්වයට පත් වී තිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සහ සමාගම් අරමුදලේ ප්‍රධාන විධායක තනතුර වන "සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්" තනතුර සඳහා වසර 4 ක පමණ කාලයක සිට ස්ථිර නිලධාරියකු පත් නොකර රාජකාරී ඉටු කිරීමට පමණක් නිලධාරියකු පත් කර තිබුණි. මීට අමතරව ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය තුල පවතින සමාගම් රෙජිස්ට්‍රාර් තනතුර සහ සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් තනතුරු 7 න් 3 කම පුරප්පාඩුව පැවැතුනි.

(ආ) ව්‍යාපාර විශ්ලේෂණ සහකාර නිලධාරි තනතුරු 8 ක් පුරප්පාඩුව පැවතුනු අතර එම පුරප්පාඩු පිරවීම සඳහා මෙතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවට සුවිශේෂී තනතුරක් වූ "සමාගම් පරීක්ෂක" තනතුරු 4 ක් අනුමත වුවත්, දැනට එක් සමාගම් පරීක්ෂක නිලධාරියකු පමණක් සේවයේ නියුතුව තිබුණි. මේ නිසා, සමාගම් පනතේ විධිවිධානයන් පැහැර හරිනු ලබන සමාගම්වලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම, සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීම වැනි ක්‍රියාමාර්ග සඳහා මෙම තත්ත්වය ඍජුවම අහිතකර ලෙස බලපානු ලබන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ කටයුතු දිස්ත්‍රික් මට්ටමින් ව්‍යාප්ත කරලීම සඳහා බඳවා ගත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කරන ලද සංවර්ධන නිලධාරීන් 12 දෙනෙකුගේ කාර්යයන් ඍජුව අධීක්ෂණය කිරීම සඳහා වූ ක්‍රමවේදයක් ආයතනය තුළ නොතිබූ අතර, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා මාණ්ඩලික නිලධාරියකුද පත්කර නොතිබුණි.

(ඉ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් දෙපාර්තමේන්තුවට අනුමත කරන ලද මුළු නිලධාරි සංඛ්‍යාව 162 ක් වුවත්, 2014 දෙසැම්බර් 31 දින වන විට මෙහි සිටි නිලධාරි සංඛ්‍යාව 104 ක් විය. ඒ අනුව නිලධාරීන් 58 ක් පුරප්පාඩුව පැවති අතර, සමාගම් පනත බලගැන්වීමේදී මෙය අහිතකර ලෙස බලනොපානු ඇතැයි යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විය.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-------------------------------------------

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

---------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, ක්‍රියාකාරී සැලැස්ම මගින් අරමුදල විසින් තම අරමුණු ඉටු කර ගැනීම සඳහා සිදු කරනු ලබන එක් එක් කාර්යයන්ගේ ස්වභාවය සහ ඒවා සඳහා වගකිවයුතු නිලධාරීන් සහ අංශ, අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ගතවන කාලසීමාව ආදිය වෙන වෙනම දක්වා නොතිබුණි. ඒ අනුව විගණනයේදී ක්‍රියාකාරී සැලැස්ම මගින් අරමුදලේ කාර්යසාධනය ඇගැයීම අපහසු වී තිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

------------------------

2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්.ඒ./2009(1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සමාගම් අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී සිදුකර නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

-------------------------------

අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර, සියයට 04ක සිට සියයට 78ක් දක්වා පරාසයක විචලනයන් සහ අයවැයගත ආදායම් සහ තථ්‍ය ආදායම් අතර සියයට 42ක සිට සියයට 70ක් දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින් වර සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

(ආ) සීමිත සමාගම් නියාමනය කිරීම

(ඇ) ප්‍රසම්පාදනය

(ඈ) ස්ථාවර වත්කම් පාලනය

(ඉ) මානව සම්පත් කළමනාකරණය